# ②ව්‍යවසායකත්වය හා ව්‍යාපාර අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවය - පිළිතුරු

(1)

1. මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය, බෙදාහැරීම හා සම්බන්ධ වූ සියලු කටයුතු ව්‍යාපාර ලෙස හඳුන්වයි.

2. ව්‍යාපාර කටයුතුවල එනම් මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය, බෙදා හැරීම හා සම්බන්ධ කටයුතුවල නිරතවන්නා ව්‍යාපාරිකයා නම් වේ.

3. ජීවත්වීම සඳහා අනිවාර්යයෙන්ම සපුරාගත යුතු දෑ අවශ්‍යතා නම් වන අතර, මිනිසාගේ අවශ්‍යතා සපුරාගන්නා විවිධ ස්වරූප වුවමනා නම් වේ.

4.

| අවශ්‍යතා | වුවමනා |
|---|---|
| ආහාර | බත්, රොටී, ඉඳිආප්ප |
| අධ්‍යාපනය | දුරස්ථ අධ්‍යාපනය, පෞද්ගලික පාසල්, රජයේ පාසල් |
| නිවාස | පැල්පත්, සාමාන්‍ය නිවාස, දෙමහල් නිවාස |
| ප්‍රවාහනය | මෝටර් රථ, බසය, බයිසිකලය |

5.

| අවස්ථා | භාණ්ඩ හා සේවා |
|---|---|
| ස්නානය | සබන්, ෂැම්පු, කන්ඩිෂනර් |
| කාන්තාවකට මංගල අවස්ථාවකට සහභාගී වීම | සාරි, ආභරණ, රූපලාවන්‍ය සේවා |
| ආගමික වතාවත් සිදු කිරීම | මල්, පහන්, සුවඳ දුම් |
| නිවසේ ආරක්ෂාව සලසා ගැනීම | ඉබි යතුරු, වැට, රක්ෂණ ආවරණ |

6.

i.

| අවශ්‍යතා | වුවමනා |
|---|---|
| මූලිකව පැන නගියි | අවශ්‍යතා මතු වූ පසු දෙවනුව පැන නගියි |
| සීමිතය | අසීමිතය |
| සියලු දෙනාටම පොදුය | එක් එක් අයගේ පෞද්ගලිකත්වය අනුව වුවමනා විවිධ වේ |
| උත්පත්තිය සමඟ ඇති වේ | පුද්ගලයන්ට අවශ්‍ය පරිදි ව්‍යවසායකයන් හෝ ව්‍යාපාරිකයන් නිර්මාණ කරයි |

ii. මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලන ඕනෑම දෙයකි.

iii.

| භාණ්ඩ | සේවා |
|---|---|
| භෞතික පැවැත්මක් ඇත | භෞතික පැවැත්මක් නැත |
| සමජාතීය වේ | සමජාතීය නොවේ |
| ගබඩා කළ හැකිය | ගබඩා කළ නොහැකිය |
| සපයන්නාගෙන් වෙන් කළ හැකිය | සපයන්නාගෙන් වෙන් කළ නොහැකිය |
| පාරිභෝගිකයා නිෂ්පාදන ක්‍රියාවලියට අත්‍යවශ්‍ය නොවේ | පාරිභෝගිකයා නිෂ්පාදන ක්‍රියාවලියට අත්‍යවශ්‍ය වේ |

iv.

(A) සෞඛ්‍ය - රෝහල් (රජයේ, පෞද්ගලික) ආයුර්වේද ඔසු සැල් වැනි

(B) සන්නිවේදනය - පුවත්පත්, දුරකථන, සමාජ මාධ්‍ය වැනි

7.

- ව්‍යාපාරයේ සම්පත් ගනුදෙනුවල යෙදවීම
- ගනුදෙනු අඛණ්ඩව සිදු වීම
- අරමුණක් පැවතීම
- අවදානමක් පැවතීම
- මූල්‍යමය ගනුදෙනු සැලකිල්ලට ගැනීම
- ආර්ථික කටයුත්තක් වීම

8.

- ආර්ථික කටයුත්තක යෙදවීම
- අවදානමකට මුහුණ දීම
- ගනුදෙනුවල නිරත වීම
- සම්පත් භාවිතා කිරීම
- නිෂ්පාදනය, මිලදී ගැනීම හා විකිණීම සම්බන්ධ තීරණ ගැනීම
- තරඟයට මුහුණ දීම
- පැවැත්ම ගැන සිතීම
- ස්වයං පෙළඹවීමක් තිබීම

9. සෑම ව්‍යවසායකයෙක්ම ව්‍යාපාරිකයෙක් නොවන අතර සෑම ව්‍යාපාරිකයෙක්ම ව්‍යවසායකයෙක් ද නොවේ. සමහර ව්‍යාපාරිකයෝ ව්‍යවසායකයෝ වන අතර සමහර ව්‍යවසායකයෝ ව්‍යාපාරිකයෝ වන බව මෙම සටහනෙන් නිරූපනය වේ.



වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

10. එකඟ වේ. ව්‍යාපාරිකයා යනු, මිනිසාට අවශ්‍ය භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම. විකිණීම, බෙදා හැරීම ආදී කටයුතුවල නිරතවන්නාය.
ව්‍යවසායකයා යනු, ව්‍යවසායකත්ව අදහසක් ක්‍රියාකාරීත්වයට පරිවර්තනය කිරීම පිණිස සැලසුම් සකස් කිරීම, නිවැරදි තීරණ ගැනීම ඔස්සේ ආර්ථික, සමාජීය පරිවර්තනයකට විශාල ලෙස දායක වන්නා වූ පුද්ගලයෙකි. ඔහු ව්‍යාපාරිකයෙක් පමණක්ම නොවේ. ආයතනයක ඉහළ කළමනාකාරීත්වයක්, සමාජ ගැටලුවකට පිළිතුරු සෙවූ පුද්ගලයෙක් ආදී ලෙස ඔවුන්ගේ විෂය පථය පුළුල්වේ. මේ අනුව ලාභ ඉපයීම අරමුණු කර ගත් ව්‍යාපාරිකයාට වඩා ව්‍යවසායකයන්ගේ කටයුතු පුළුල්ය.

11.

| ව්‍යාපාරිකයා | ව්‍යවසායකයා |
|---|---|
| ව්‍යාපාර කටයුතුවල යෙදෙන්නේ ගතානුගතික හා සම්ප්‍රදායික ක්‍රමයකටය | පරිසරයේ වෙනස්කම් සැලකිල්ලට ගනිමින් නිර්මාණශීලී නවෝත්පාදන පදනම් කරගෙන ව්‍යාපාර කටයුතු මෙහෙයවයි. |
| අවදානමට එතරම් කැමැත්තක් නොදක්වයි | අවදානම් හොඳින් තක්සේරුකර, දැරිය හැකි අවදානම භාර ගනී |
| තරඟයට මුහුණදීමට එතරම් කැමැත්තක් නොදක්වයි | තරඟය කැමැත්තෙන් සොයයි |
| පවතින සම්පත්වලින් වුවද උපරිම ප්‍රයෝජන නොගනියි | පවතින සම්පත් අවශ්‍යතාවලට අනුව උපරිම ලෙස ප්‍රයෝජනයට ගනියි |
| ගතානුගතිකව ගැටලු විසඳීමට උත්සාහ ගනියි. ඉතා ආසන්න ඉලක්ක ඇති කර ගනී. | ගැටලු නිර්මාණශීලීව විසඳයි. දිගුකාලීන දැක්මක් සහිතව දූරදර්ශීව ඉලක්ක පිහිටුවා ගනී. |
| ව්‍යාපාරය තිබෙන තත්ත්වයෙන්ම පවත්වා ගැනීමෙන් සෑහීමකට පත් වේ. | ව්‍යාපාරය දිනෙන් දින පුළුල් කර ගනියි. පවතින තත්ත්වය පිළිබඳ සෑහීමට පත් නොවේ. |

12. එම ප්‍රකාශය සත්‍යයකි. ව්‍යාපාරිකයා යන සංකල්පයට වඩා ව්‍යවසායකයා යන සංකල්පය තුළ නිර්මාණශීලී බව, අවදානම් අභියෝග ලෙස සැලකීම, අනාගත දැක්ම, සුභවාදී වීම, තරඟයට කැමැත්ත, සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීම ආදී සුවිශේෂී වූ ලක්ෂණයන් දැකිය හැකිය. ව්‍යවසායක ව්‍යාපාරිකයෝ තම ව්‍යාපාරය දිනෙන් දින ඉහළ මට්ටමකට රැගෙන යන අතර සාමාන්‍ය ව්‍යාපාරිකයෝ සාම්ප්‍රදායක ආකාරයකට තම ව්‍යාපාර කරගෙන යති.

13. මෙහිදී ව්‍යවසායකයෙකු ලෙස නිර්මාණශීලී වන බව, ගැටලු හඳුනාගෙන එයට විසඳුමක් ලෙස නවෝත්පාදනයක් බිහි කිරීමට අදහසක් ඇති බව, කුමක්, කෙසේ, කොපමණ නිපදවන්නේද යන නිෂ්පාදන තීරණ ගන්නා බව, අනාගත දැක්මක් සහිතව, සුභවාදීව අවදානමක් දරමින් එම කටයුත්ත ආරම්භ කිරීමට සැලසුම් කරන බව වැනි කරුණු පිළිතුරෙහි අඩංගු විය යුතුය.

14.

- ව්‍යාපාර ව්‍යවසායකයෝ
- සමාජීය ව්‍යවසායකයෝ
- අභ්‍යන්තරික (ආයතනික) ව්‍යවසායකයෝ

15.

i. ව්‍යාපාර ව්‍යවසායකයෙකි

ii. සමාජීය ව්‍යවසායකයා
ආයතනික ව්‍යවසායකයා

iii. ආර්ථික කටයුත්තක යෙදීම
අවදානමකට මුහුණ දීම
ගනුදෙනුවල නිරත වීම
සම්පත් භාවිතා කිරීම
නිෂ්පාදන මිලදී ගැනීම හා විකිණීම සම්බන්ධව තීරණ ගැනීම
තරඟයට මුහුණ දීම
පැවැත්ම ගැන සිතීම
ස්වයං පෙළඹවීමක් තිබීම

iv.

| ව්‍යාපාරිකයා | ව්‍යවසායකයා |
|---|---|
| ව්‍යාපාර කටයුතුවල යෙදෙන්නේ ගතානුගතික හා සම්ප්‍රදායික ක්‍රමයකටය | පරිසරයේ වෙනස්කම් සැලකිල්ලට ගනිමින් නිර්මාණශීලී නවෝත්පාදන පදනම් කරගෙන ව්‍යාපාර කටයුතු මෙහෙයවයි. |
| අවදානමට එතරම් කැමැත්තක් නොදක්වයි | අවදානම් හොඳින් තක්සේරුකර, දැරිය හැකි අවදානම භාර ගනී |
| තරඟයට මුහුණදීමට එතරම් කැමැත්තක් නොදක්වයි | තරඟය කැමැත්තෙන් සොයයි |
| පවතින සම්පත්වලින් වුවද උපරිම ප්‍රයෝජන නොගනියි | පවතින සම්පත් අවශ්‍යතාවලට අනුව උපරිම ලෙස ප්‍රයෝජනයට ගනියි |
| ගතානුගතිකව ගැටලු විසඳීමට උත්සාහ ගනියි. ඉතා ආසන්න ඉලක්ක ඇති කර ගනී. | ගැටලු නිර්මාණශීලීව විසඳයි. දිගුකාලීන දැක්මක් සහිතව දූරදර්ශීව ඉලක්ක පිහිටුවා ගනී. |
| ව්‍යාපාරය තිබෙන තත්ත්වයෙන්ම පවත්වා ගැනීමෙන් සෑහීමකට පත් වේ. | ව්‍යාපාරය දිනෙන් දින පුළුල් කර ගනියි. පවතින තත්ත්වය පිළිබඳ සෑහීමට පත් නොවේ. |

v.

- මහතුන්ගේ ඇඳුම් සමඟ ළමා හා කාන්තා ඇඳුම් ද අලෙවි කිරීමට කටයුතු කිරීම.
- ආයතනයට ඇතුල් වන කුඩා ළමුන්ට  ක්‍රීඩා භාණ්ඩයක් තෑගි වශයෙන් ලබාදීම.
- කූපන් ක්‍රමයකින් බිල්පත් සඳහා ත්‍යාග ලබා දීම
- ආයතනයේ සේවකයන් සඳහා වසරකට වතාවක් විනෝද චාරිකාවක් සංවිධානය කිරීම යන  ආදිය

16. භාණ්ඩ නිෂ්පාදනය හෝ බෙදා හැරීම සඳහා සීමාසහිත වූ සම්පත් භාවිතා කිරීම නිසාත් මිල මත ගනුදෙනු සිදු කිරීම යන නිසාත් මෙය ආර්ථික කටයුත්තක් ලෙස හැඳින්වේ.

(2)

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. | √ | 2. | X | 3. | X | 4. | √ | 5. | √ |
| 6. | X | 7. | √ | 8. | X | 9. | X | 10. | √ |
| 11. | X | 12. | √ | 13. | X | 14. | X | 15. | √ |

(3)

1. වුවමනා
2. අවශ්‍යතා
3. ව්‍යාපාරිකයා
4. භාණ්ඩ හා සේවා
5. ස්පෘශ්‍ය
6. සේවාය
7. අවශ්‍යතා, වුවමනා
8. ව්‍යවසායකයෙකු
9. ව්‍යාපාරිකයෝද
10. සමාජීය